**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධපාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී,ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව,ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරවවිගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 880 | රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුව ඇප තැබිය යුතු වුවත්, නිලධාරීන් 04 දෙනෙකුගෙන් ඇප ලබා ගෙන නොතිබුණි. | රේඛිය අමාත්‍යංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් තැබිය යුතු ඇපයේ වටිනාකම තීරණය කරමින් චක්‍රලේඛයක් නිකුත් කළ පසු ඇප තැබීමට අවශ්‍යය කටයුතු සිදු කරනු ලැබේ. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | චක්‍රලේඛ | | | |
| | (i) 2009 ජූනි 09 දිනැති අංක DMA/2009(I) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 09 ඡේදය | සෑම අභ්‍යන්තර විගණන ඒකකයක්ම තම ආයතනය වෙනුවෙන් කාර්තුවකට වරක් අභ්‍යන්තර විගණන වාර්තාවක් පිළියෙල කර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2019 ජනවාරි 01 දිනැති 01/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අභ්‍යන්තර විගණන චක්‍රලේඛය මඟින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් විගණන කටයුතු කළයුතු බවට | චක්‍රලේඛයට අනුගත වීම සඳහා පාලන ක්‍රමය කඩිනමින් සැලසුම් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | දක්වා ඇති බවත්, ඒ අනුව අවශ්‍ය කාර්යය මණ්ඩලය අනුයුක්ත කළ පසු විධිමත් පරිදි අභ්‍යන්තර ඒකක පිහිටුවා විගණන කටයුතු කිරීමට හැකි වේ. | |
| | (ii) 2017 අගෝස්තු 14 දිනැති අංක NP/SP/SDG/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 “න්‍යාය පත්‍රය” | සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිහිටුවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධව කෙටුම්පත් කළ සැලැස්ම 2019 දෙසැම්බර් 31 දින කළමනාකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කළ අතර එහිදී හඳුනා ගන්නා වෙනස්කම් සහිතව නැවත කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දෙන ලදී. මේ සම්බන්ධයෙන් ආයතනය මේ වන විට කටයුතු සිදු කරගෙන යනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2015 අප්‍රේල් 09 දිනැති අංක 9/4 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ආචාර ධර්ම හා අධ්‍යයන වගකීම් පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 5 වන මාර්ගෝපදේශය | ආචාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයින් අතර ද්වි සම්බන්ධතා(Dual Relationship with Students)අනාවරණය කර ගැනීමට හෝ මේ මඟින් තත්ත්ව පාලනයට ඇතිවිය හැකි අහිතකර තත්ත්වයන් වළක්වා ගැනීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ආයතනය දැනට පේරාදෙණිය විශ්ව විද්‍යාල මඟින් ක්‍රියාත්මක කරනු ලබන ආචාරධර්ම හා අධ්‍යයන වගකීම පිළිබඳ මාර්ගෝපදේශයන්ට අනුගතව කටයුතු කරනු ලබයි. 2021 වර්ෂය තුළ මෙම සියලු කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය. | අභ්‍යන්තර මාර්ගෝපදේශයන්ට අනුව පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කර පවත්වාගෙන යා යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය | අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුවක් පිළියෙල කළයුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ආයතනය එහි අපේක්ෂිත ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරි වර්ෂ 03 ක කාලයක් සඳහා සකසා නොතිබූ බව සත්‍යයකි. ආයතනයේ අපේක්ෂිත ප්‍රසම්පාදන සැලැස්ම සැකසීම සඳහා මේ වන විට අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇත. | රජයේ මාර්ගෝපදේශය න්ට අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.43,123,612 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.48,993,216ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,869,604 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අභ්‍යන්තර ආදායම් ඉපැයීම රු.4,539,070 කින් අඩුවීම හා ජංගම නොවන වත්කම් ක්ෂය රු.1,056,139 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් දැනට පවත්වාගෙන යනු ලබන පාඨමාලාවලින් පාඨමාලා 51 ක් සඳහා විගණන දින වන විටත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම පාඨමාලාවන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ආරම්භ වීමට ප්‍රථමව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සහ පාලක සභාවේ අනුමැතිය සහිතව 1950 ගණන් වල ආරම්භ කර වරින් වර සංවර්ධනය කර පිරිනමා ඇත. කෙසේ වුවත් මෙම පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමට අදාළ තොරතුරු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට 2019 දෙසැම්බර් මස 4 වන දින යවා ඇත. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය කඩිනමින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් එක් රැස් කිරීම, සුළු මුදල්භාරකරු වශයෙන් කටයුතු කිරීම සහ පරිගණකයට ඒ සම්බන්ධ ගනුදෙනු ඇතුළත් කිරීම එකම නිලධාරියෙකු විසින් කරනු ලැබීම හේතුවෙන් අභ්‍යන්තර පාලනය දුර්වල මට්ටමක පැවතුණි. | ගිණුම් අංශය තුළ ස්ථිර සේවකයින්ගේ අඩුපාඩුවක් ඇති බැවින් එකම පුද්ගලයින්ට වැඩි වගකීමක් ඇති රාජකාරීන් පවරා ඇත. මේ වන විටත් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත ස්ථිර පදනම මත සේවකයින් බඳවා ගැනීම සඳහා අවශ්‍යය කටයුතු සිදු කරගෙන යන බැවින් ඉදිරියේදී එම සේවකයින් ගිණුම් අංශයේ සේවය සඳහාද යොදා ගනු ලැබේ. | ප්‍රශස්ත අභ්‍යන්තර පාලනයන් පවත්වා ගෙන යා හැකි පරිදි ගිණුම් අංශයේ රාජකාරී කටයුතු බෙදා වෙන්කර පවත්වා ගෙන යා යුතුය. |
| (ඇ) | ආයතනයේ ගොඩනැගිල්ල නවීකරණය කිරීම සඳහා 2018 වර්ෂයේ වෙන් කරන ලද මුදලින් රු.1,170,025 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඌන උපයෝජිතව තිබුණි. | අදාළ කොන්ත්‍රාත්කරු නිමකළ වැඩ කොටසට ගෙවීම් කටයුතු සිදුකළ අතර හැකි ඉක්මණින් කොන්ත්‍රාත්තුවේ ඉතිරි වැඩකටයුතු නිම කර අදාළ ගෙවීම් කටයුතු සිදු කිරීමට අවශ්‍යය පියවර මේ වන විට ගෙන ඇත. | අරමුදල් ලැබී ඇති කාර්යය සඳහා කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | ආයතනයේ පිවිසුම් මාර්ගය පුළුල් කිරීම හා වාහන ගරාජයක් ඉදිකිරීම සඳහා වූ රු.4,666,843 ක මුදලකට ගිවිසුම්ගත වූ කොන්ත්‍රාත්තුව 2019 මැයි 27 වන දින වන විට අවසන් කිරීමට නියමිතව පැවතුණද 2020 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. | බිල්පත් ගෙවීම ප්‍රමාද වීම සහ අමතර වැඩ අනුමත කිරීම ප්‍රමාද කිරීම හේතුවෙන් මෙම තත්ත්වය හටගෙන තිබුණි. හැකි ඉක්මණින් කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු අවසන් කිරීමට කටයුතු කරමින් ඇත. | ඉදිකිරීම් කොන්ත්‍රාත් ගිවිසගත් කාල පරිච්ඡේදය තුළ නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා ව්‍යවහාරික ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති උපාධිය සහ ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති උපාධියට සිසුන් ලියාපදිංචි කර උපාධි පාඨමාලාවේ පළමු සමාස විභාගයද අවසන් වූ පසුව එම පාඨමාලාවන් සඳහා සිසුන් 04 දෙනෙකු ලියාපදිංචි කර තිබුණි. ආයතනයේ නීති රීති හා මාර්ගෝපදේශයන්ට පටහැනිව එක් කණ්ඩායමකට පමණක් ලබාදුන් වරප්‍රසාදයක් බවත් මේ සඳහා ලියාපදිංචි වීමට අපේක්ෂිත අයට සිදුවූ අසාධාරණයක් බවත් නිරීක්ෂණය විය. | ශිෂ්‍ය ඉල්ලීම මත 2019/2020 අධ්‍යයන වර්ෂයේ දෙවන සමාසිකය සඳහා ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවට ඉල්ලුම්කරුවන් දෙදෙනෙකු ඇතුළත් කරගත් බව සත්‍යයකි. අදාළ ඉල්ලුම්කරුවන්ගේ අයදුම්පත සලකා බැලූ ආර්ථික විද්‍යාව සහ කළමනාකරණය සඳහා වන අධ්‍යයන මණ්ඩලය එම ඉල්ලුම්කරුවන් සතුව දෙවන සමාසිකය සඳහා ඇතුලත් වීමට අදාළ සුදුසුකම් සපුරා තිබීම නිසා ඔවුන් දෙවන සමාසිකය සඳහා ඇතුළත්වීමට සිදුකළ නිර්දේශ මත මෙම ඇතුළත් කරගැනීම සිදුකරගෙන ඇත. | ආයතනයේ නීති රීති හා මාර්ගෝපදේශයන්ට පටහැනිව සිසුන් ලියාපදිංචි නොකළ යුතුය. අදාළ ආයතනවලින් අනුමැතිය ලබාගෙන ප්‍රමාණවත් ප්‍රචාරනයක් ලබාදී විධිමත් පරිදි පාඨමාලාවට සිසුන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| Minan Buddhist Collage China ආයතනයෙන් ප්‍රදාන වශයෙන් 2017, 2018 හා 2019 වර්ෂවලදී විදේශීය සිසුන් සඳහා නවාතැන් පහසුකම් සංකීර්ණයක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම වෙනුවෙන් ලැබී තිබූ රු.6,699,195ක මුදලක් විගණිත දිනය දක්වාම නිෂ්කාර්යව පැවතුණි. | ආයතනය විසින් මෙම මුදල් ශිෂ්‍ය නේවාසික ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා යොදා ගැනීමට තීරණය කළ අතර මේ වනවිටත් අදාළ ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ පරිපාලනය හා අදාළ වෙනත් ආයතන සමඟ කටයුතු කරමින් සිටින අතර එහි ඉදිකිරීම් කටයුතු 2021 වසර තුළ ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. | අරමුදල් කඩිනමින් උපයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය වෙනුවෙන් වෙන්කළ රු.මිලියන 04 ක සහ ස්ථාවර වත්කම් වෙනුවෙන් වෙන් කළ රු. මිලියන 08 ක ප්‍රසම්පාදන කටයුතු සමාලෝචිත වර්ෂයේදී නිම කර නොතිබුණි. | ආයතනයේ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම නිවැරදි ආකාරයට යාවත්කාලීන කිරීම පසුගිය කාලය තුළ සිදුකර නොතිබිණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) වගන්තිය ප්‍රකාරව ආයතනයේ ප්‍රසම්පාදන සැලැස්ම අදාළ කාලසීමාව තුළ යාවත්කාලීන කිරීමටත් ඒ සඳහා අවශ්‍යය අනුමැතීන් ලබාගැනීමටත් අවශ්‍යය ක්‍රියාමාර්ග දැනටමත් ආයතනය විසින් ගෙන ඇත. | ප්‍රමුඛතාවය අනුව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත කාර්යය මණ්ඩලයේ තනතුරු 09 ක තත්‍ය කාර්යය මණ්ඩලය 13 දෙනෙකු සේවයේ යෙදී සිටි නමුත් කොන්ත්‍රාත් පදනම මත 16 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළ රු.6,067,134 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | ආයතනය විසින් වැඩි වන අවශ්‍යතාවයට අනුරූපව ආයතනයට අවශ්‍යය නව තනතුරු හඳුනාගත් අතර ඒ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අවස්ථා කිහිපයකදීම ස්ථිර කාර්ය මණ්ඩල තනතුරු අනුමත කරගැනීම වෙනුවෙන් ඉල්ලීම් සිදු කර ඇත. එතෙක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා | කාර්යය මණ්ඩලය අනුමත සීමාව තුළ පවත්වාගෙන යා යුතුය. |

චක්‍රලේඛ 2016/04 ප්‍රකාරව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇත.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අයවැයගත ආදායම්/වියදම් සමඟ තත්‍ය ආදායම්/වියදම් සැසඳීමේදී අයිතමයන් 12 ක සියයට 20 සිට සියයට 85 දක්වා විචලනයක් වූයෙන් අයවැය ලේඛන ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි. | 2020 වර්ෂය තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්වය මත සමහර වියදම් සිදු කිරීමට අවස්ථාවක් නොලැබීම මෙම විචලනය ඇති වීමට ප්‍රධාන හේතුවකි. මේ නිසා අයවැයගත වියදම් හා සත්‍ය වියදම් සමග සැසඳීමේදි යම් සත්‍ය වියදම්වල වැඩි වීමක් හෝ අඩු වීමක් දක්නට ලැබේ. මෙම කටයුතු සම්බන්ධයෙන් වඩාත් නිවැරදි පුරෝකථන කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | තාත්වික අයවැය ඇස්තමේන්තු පිළියෙල කර ඊට අනුගත විය යුතුය. |